(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(10).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 ඔක්තෝබර් 07 සිකුරාදා**

---

**2022 ඔක්තෝබර් 18 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය,— 2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මැයි 31 දිනැති අංක 2282/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22(1) වගන්තිය යටතේ බෝතල් කරන ලද රා මත සුරාබද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අප්‍රේල් 29 දිනැති අංක 2277/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2022 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ ඊතයිල් මද්‍යසාර සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජුනි 08 දිනැති අංක 2283/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2022 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ අපගමන බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 මාර්තු 27 දිනැති අංක 2272/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ 2021 ජූනි 30 දිනැති අංක 2234/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සංශෝධනය කරමින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 සැප්තැම්බර් 08 දිනැති අංක 2296/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— බන්ධනාගාර ආඥාපනත යටතේ රීති,— (54 අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ 94 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූලි 12 දිනැති අංක 2288/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.07 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2022 නොවැම්බර් 10 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1515/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වී ගොවිතැන් සිදු කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය සහ වී ගොවිතැන් සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා වී ගොවිතැනෙන් ඉවත් වූ පවුල් සංඛ්‍යාව;

(iii) එම කාලය තුළ වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීමට වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු පොහොර අවශ්‍යතාවය එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල හා ආනයනය කරන ලද පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1525/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඉපලෝගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීම හේතුවෙන් මේ වනවිට එම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා "රණජයපුර" නිවාස සංකීර්ණයට අයත් නිවාස භාවිතා කරනු ලබන බවත්;

(ii) මෙම පොලිස් ස්ථානයට අදාළ බලප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරි වසම් 33ක් අයත් වන බවත්;

(iii) එම පොලිස් ස්ථානයට ලබාදී ඇති නිල රථය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) පොලිස් ස්ථානයේ භාවිතය සඳහා නව නිල රථයක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1673/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු කම්කරුවකුගේ දෛනික වැටුප කොපමණද;

(ii) එම දෛනික වැටුප, රුපියල් 1000/-ක් දක්වා වැඩි කිරීම සඳහා තීරණය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1896/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන යටතේ ජාතික පාසල් බවට පත් කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iv)හි සඳහන් පාසල් තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(ii) ජාතික පාසල් බවට පත් කරනු ලබන පාසල්වලට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ අභයභූමිවල සහ වනාන්තරවල සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) ජනතාව සහ ඔවුන්ගේ දේපළ එම වන අලින්ගෙන් ආරක්ෂාකර ගැනීම පිණිස අලිවැට ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් අලිවැට ඉදිකිරීමට අපේක්ෂා කරනු ලබන ගම, එම ගම අයත්වන ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් අලිවැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල, ඉදිකිරීම් ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2039/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2022

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2059/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හොරණ, වගවත්ත ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියට යටිතල පහසුකම් ලබා දීම සඳහා භාවිතා කරන ලද අරමුදල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාව සඳහා ලබා දී ඇති විදුලි සම්බන්ධතාවය මෙගාවොට් කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා ජල සැපයුම ලබා දෙන ලද ආකාරය කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා රජය විසින් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2171/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මැදවච්චිය, අ/ මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය මේ වනවිට විශාල පරිහානියකට ලක්වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම පරිහානිය වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2519/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික අධ්‍යාපන පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම අධ්‍යාපන පීඨවල එක් එක් භාෂා මාධ්‍ය අනුව පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාඨමාලාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විද්‍යාපීඨ ගුරු පුහුණුව සඳහා සිසුන් හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 නොවැම්බර් 11 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විශ්‍රාමික ග්‍රාම නිලධාරීන් හට සාම විනිසුරු පදවි ලබාදීම,— ග්‍රාමීය වශයෙන් ජනතාවට ඉතා සමීප සේවාවක් ඉටු කරන සුවිශේෂී රාජ්‍ය නිලධාරියකු වන ග්‍රාම නිලධාරීවරයන් විශ්‍රාම යාමෙන් අනතුරුව ඔවුන්ගේ සේවය තවදුරටත් ගෞරවනීය සේවාවක් ලෙස ලබා ගැනීම සඳහා දැනට විශ්‍රාමික සහ ඉදිරියේ දී විශ්‍රාම ගන්වනු ලබන ග්‍රාම නිලධාරීන්ගේ සුදුසුකම් අනුව සාම විනිසුරු පදවිය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ සහල් මිල පාලනය කිරීමට හැකියාව ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වර්තමානය වනවිට දුෂ්කරතා රැසකට මුහුණ දී සිටින බැවින්, එම ගැටලු විසඳීමට කඩිනමින් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම,— දරුවන්ට එරෙහිව සිදුවන ශාරීරික දඬුවම් හා මානසික හිංසන හෙළාදකිමින් 2021.02.12 දින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/97/2017 මඟින් දණ්ඩ නීති සංග්‍රහයේ අංක 341(i) වගන්තිය අහෝසි කිරීම, UNCRC හි වගන්ති අංක 19, 28(2) සහ 37 ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 12/2016 ක්‍රියාත්මක කිරීම සඳහා තීන්දුවක් ලබා දී ඇති හෙයින් ද, 2020.03.01 දින අවුරුදු 08 ක දැරියක් නිවසේදී වේවැලකින් පහර දී මරණයට පත්කිරීමේ සිදුවීම පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය අවධානයට ලක් වුවද ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත හෝ ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු පියවර ගනු නොලැබූ හෙයින් ද, දරුවන්ට ඇතිවිය හැකි දීර්ඝකාලීන අහිතකර ප්‍රතිවිපාක ඉස්මතු කරමින් 2018.02.02 එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ කමිටුවේ (UNCRC) ශ්‍රී ලංකාව පිළිබඳ අධීක්ෂණ වාර්තාව මඟින් ළමා ආරක්ෂණයේ අර්බුදකාරී තත්ත්වය, විශේෂයෙන්ම ශාරීරික දඬුවම් අවසන් කිරීම අවධාරණයට ලක් කර ඇති හෙයින් ද, 2020.10.06 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා අංක 304/2020 හි සඳහන් වන පරිදි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් විශාල වශයෙන් ඉහළ යන ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ සේවාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව ප්‍රකාශ කර ඇති හෙයින් ද, කඩිනමින් නීති වෙනස් කිරීමෙන් සහ පවතින නීති විධිමත්ව ක්‍රියාත්මක කිරීමෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික අර්බුදය අවසන් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය ස්ථාපනය කිරීම,— රජය නියෝජනය කරමින් හා ග්‍රාමීය ජනතාවට සමීපව කටයුතු කරමින් සුවිශාල මෙහෙවරක් ඉටු කරන ග්‍රාම නිලධාරීන් සඳහා වූ ව්‍යවස්ථාවක් නිර්මාණය කර "ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය" ලෙස ස්ථාපනය කිරීමට නිසි පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සහනාධාර ලැබිය යුතු පුද්ගලයන්ට සමෘද්ධි සහනාධාර ලබාදීම,— සමෘද්ධිලාභීන් මෙන්ම සමෘද්ධි සහනාධාර නොලබන අඩු ආදායම්ලාභී ජනතාව සම්බන්ධයෙන් විධිමත් සමීක්ෂණයක් සිදුකර සත්‍ය වශයෙන්ම සමෘද්ධි සහනාධාර ලැබිය යුතු පිරිස තෝරා ගෙන ඔවුන්ට එය ලබා දීමට සුදුසු පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම,— අධ්‍යාපන විද්‍යාපීඨවල විධිමත් ගුරු පුහුණුව අවසන් කරන්නන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සමෘද්ධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු ලබාදීම,— ග්‍රාමීය වශයෙන් තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුල්වලට සමෘධි සහනාධාරය වෙනුවට කිරි ගවයකු බැගින් ලබා දී ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අපනයනය තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික රටක් ලෙස ගොවි ජනතාවට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් හා සේවා රජයේ මැදිහත්වීමෙන් ලබා දී ආනයනය වෙනුවට අපනයනය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා නිශ්චිත ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ තනතුරු සඳහා නිශ්චිත ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් මේ වනවිට සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය සතුව තිබුණ ද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා මෙතෙක් ස්ථාන මාරුවීම් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට නොමැති හෙයින් එම නිලධාරින් අසහනයට පත්ව ඇති හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා ද ජාතික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙන්ම ගුරු/ විදුහල්පති ස්ථාන මාරුවීමේ ජාතික ප්‍රතිපත්තිය ද සක්‍රීය කිරීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් කිරීම,— සංවර්ධිත රටවල පවා ගොවි ජනතාව වෙනුවෙන් විවිධ සුබසාධන වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය කාලීන අවශ්‍යතා අනුව වෙනස් නොවීම හේතුවෙන් ඒ සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති හෙයින් ද, ගොවි ජනතාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන ආකාරයට මෙම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය රජය විසින් නැවත සමාලෝචනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම,— පවත්නා කොවිඩ්-19 වසංගතය හමුවේ වර්තමානය වනවිට පාසල් වසා දමා තිබීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ප්‍රයෝජනවත් වන අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවක් රජය විසින් කඩිනමින් ආරම්භ කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2022

ගරු රෝහණ බංඩාර මහතා,— පළාත් පාලන ආයතනවල රැකියා ලබා දීමේ දී සාධාරණ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම,— මහජනතාව වෙනුවෙන් උපතේ සිට මරණය දක්වාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරන පළාත් පාලන ආයතනවල සුළු සේවක, කම්කරු ආදී පත්වීම් ලබාදීමේ දී බොහෝ විට එම පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ කොට්ඨාසයට සුවිශේෂීතාවයක් ලබාදෙන අවස්ථා වර්තමානයේ දක්නට ලැබෙන හෙයින් එම තත්ත්වය වෙනස්කොට අදාළ පළාත් පාලන ආයතනයේ සෑම කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි එම රැකියා ලබාදීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත්වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කටුවැල් බටු දේශීය වශයෙන් වගා කිරීම,— පසුගිය වසර කිහිපය තුළ කටුවැල් බටු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් ශ්‍රී ලංකාවෙන් විදේශ රටවලට ඇදී ගිය හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දේශීය වශයෙන් කටුවැල් බටු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— ඉඟුරු වගාව ප්‍රවර්ධනය කිරීම,— පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවට ඉඟුරු ආනයනය කිරීම හේතුවෙන් විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී ගිය හෙයින් මෙරටින් විදේශ රටවලට විශාල වශයෙන් ධනය ගලායාම වැළැක්වීම සඳහා ද, ඉඟුරු වගාව දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ද, කඩිනම් වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.